# දැන්වීමයි

## තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

### පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව උතුරු පළාත

**උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්තින යාපනය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම - 2018**

01. උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ යාපනය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා දැනට උතුරු පළාතේ සේවයෙහි නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2018.03.21 වේ.

**02. සුදුසුකම්:-**
i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වනි ශ්‍රේණියේ ඇති නිලධාරියෙකු වීම.

* (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වනි ශ්‍රේණියේ ඇති නිලධාරින් ද ඉල්ලුම් කළහැකිය. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වනි ශ්‍රේණියේ ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කිසිවක් නොලැබු අවස්නාවේදි, ශ්‍රී.ල.අ.ප.සේ II වනි ශ්‍රේණියේ ඇති නිලධාරින්ගේ අයදුම්පත්, අදාළ තනතුරේ රාජකාරි ක්‍රියාත්මක පතනම් මත භාරකණු ලැබේ.)

ii. අයදුම්කරුවන් අදාල ශ්‍රේණියේ 2018.03.21 දිනට පූර්වාසන්න අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, එම කාලය තුළ ලැබියයුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම සහ කිසිදු විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති වීම.

iii. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 60 ට නොවැඩි වීම.

**03. බඳවා ගැනීමේ ක්‍රමය:-**
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් අයදුම්කරුවන් අතුරින් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛපරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත් සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවා මෙම තනතුර සඳහා පත්කරනු ලැබේ.

ව්‍යුහගත් සම්මුඛපරීක්ෂණයේදී පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.
(මුළු ලකුණු100 යි)

i. වර්තමාන ශ්‍රේණිය:- ශ්‍රී.ල.අ.ප.සේ I වනි ශ්‍රේණිය හෝ II වනි ශ්‍රේණිය (සාමානිය) /II වනි ශ්‍රේණිය (විශේෂ)
(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ලබාදී ඇති අදාල තනතුරු උසස්වීම සඳහා වන පත්කිරීම් ලිපියක් ඉදිරිපත් කළයුතුය)

ii. අධ්‍යාපන සුදුසුකම් - M.Ed. /M Phil / Post Graduate Degree /Diploma

iii. ශ්‍රේෂ්ටදාවය

iv. වැඩබලීම (Acting) :- අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

v. භාෂා නිපුණතාවය:- මව් භාෂාව ඇර වෙනත් භාෂාවේ ඇති ප්‍රවීනාවය

vi. විශේෂ ජයග්‍රහණ - පළකිරීම් හා පර්යේෂණ

vii. සම්මුඛපරීක්ෂණයේදී දක්වන කුසලතාවය

**04. ඉල්ලුම් කළයුතුතු ආකාරය:-**
මෙම දැන්වීමෙ හි අවසානයේ යොදාඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29)ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම පමණත් ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2018.03.21 දිනට හෝ ඊට ප්‍රථම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්ස භාව, උතුරු පළාත, අංකය 393/48, කෝවිල පාර, නල්ලූර් යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවියයුතුය. (අයදුම්පත්‍ර ලේකම්තුගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.) අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළයුතුය. නියමිත ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කරනොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේපකරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන්විසින් දරාගත යුතුය.

අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇතිඅතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් වියයුතුය. එසේ නොවුවුහොත් අයදුම්පත් ප්‍රතික්ෂේපවිය හැක.

05. මෙම තනතුර සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී උතුරු පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ තීරණය අවසාන් තීරණය වනඅතර, මෙම පත්කිරීම් සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසානොමැති කිසියම් කරුණු පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ.

**සි.ඒ.මෝහන්රාස්,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන්ස භාව,
උතුරු පළාත.
2018.02.27